# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2378/38 – 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා – 2024.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ කැටපලකන්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MLT/2020/628 හා 2021.02.11 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' - පුස්සහේන වත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.8521**

උතුරට: මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: දිද්දෙනිපොත වතු සමාගම හිමිකම් කියන පුස්සහේන; දකුණට: දිද්දෙනිපොත වතු සමාගම හිමිකම් කියන පුස්සහේන; බටහිරට: ජේ.ජී.ෆ්‍රැන්සිස් හිමිකම් කියන බටහේනයාය, ජේ.ජී.පියතිස්ස හිමිකම් කියන බටහේනයාය සහ එච්.ඒ.එල්.ප්‍රියන්ත ලාල් හිමිකම් කියන බටහේනයාය.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/13/2020/PC/74.
2024 පෙබරවාරි මස 01 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04-0043



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*